**ශීර්ෂය - 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය  ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් සිදුකර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම සහ ඉදිකිරීම් වටිනාකමට වඩා රු. 4,609,854ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වියදම්වල එකතුව ලෙස දක්වා තිබුණි. | සිදු වී ඇති මෙම දෝෂය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග එක්ව නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනෙකුත් උපයෝගී ලේඛන සමග එකඟ කළ හැකි විය යුතුය. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම හා යාවත්කාලීන නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදි පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව රජයේ ගොඩනැගිලිවල පවතින සියලුම විදුලි උපකරණ පිළිබඳ ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගත යුතුවේ. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය අනුව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදි නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මාර්ගෝපදේශ 2.11.2 පරිදි පැමිණීමේ ලේඛනයක් පැවැත්විය යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයකට සිදු වූ හානියක්, පාඩු හා හානි ලේඛනයේ රු. 150,832ක් වැඩියෙන් දක්වා තිබුණි. | හානි පූරණය කිරීම ප්‍රමාද වීම නිසා මුළු හානිය පොත්වලට ගෙන තිබුණි. | තථ්‍ය හානිය නිවැරදිව සටහන් කළ යුතු වීම. |

**1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**--------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | -------------------------------- | ------------- |
| කාර්යය නිම කළ බවට වූ වාර්තා (Completion Report) සකස් කර නොතිබුණු බැවින් එකතුව රු.3,914,565කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සනාථ කිරීමට නොහැකි විය. | තාක්ෂණික නිලධාරීගේ අධික කාර්ය බහුලත්වය මෙයට හේතු වී තිබුණි. | මුදල් රෙගුලාසි 780 අනුව කටයුතු කිරීම. |

**2. මූල්‍ය සමාලෝචනය**
**------------------------**

**2.1 අග්‍රිම කළමනාකරණය**
**-------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------ | ----------------------------------- | ------------ |
| ඉල්ලුම් කළ පරිදි අග්‍රිම නොලැබීම නිසා 2019 වර්ෂයේ අවසන් කළ රු.164,916,826ක ව්‍යාපෘති 769ක් සඳහා ගෙවීම් සිදුකළ නොහැකිව තිබුණි. | 2020 වර්ෂයට අග්‍රිම ලබාගත නොහැකිව තිබුණි. | ප්‍රමුඛතාව හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැය විෂයයන් 04ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.9,184,061ක ඉතිරි විම් පැවැති අතර එය එම ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් සියයට 22ත් අතර පරාසයක විය. | ඉදිරි අයවැය සකස් කිරීමේදී ඉතිරිකිරීම් අඩු කිරීමට පියවර ගනු ලැබේ. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |
| (ආ) වැය විෂයයන් 07ක පැවැති රු. 7,026,000ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් 06කට මාරු කර තිබුණි. | ඉදිරියේදී නිසි පරිදි ඇස්තමේන්තු සැකසීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (ඇ) වැය විෂයයන් 05ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා සියයට 40කට අධික ඉතිරිවීම් පැවැති වැය විෂයයන් 07කින් රු.6,875,000ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි. | -එම- | -එම- |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සලසා තිබුණු මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු මූලධන ප්‍රතිපාදන අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකිරීම නිසා රු.10,734,527ක් ඉතිරි වී තිබුණි. එය එම ප්‍රතිපාදනවලින් සියයට 10ත් 100ත් අතර පරාසයක විය. | covid -19 වසංගත තත්ත්වය මෙයට හේතු වී තිබුණි. | ප්‍රතිපාදන ඵලදායි අයුරින් භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 173,170 | විධායක මට්ටමේ නිලධාරීන් විසින් ඔවුන්ට බැඳීමක් නොමැති වාහන වෙනුවෙන් ඉන්ධන අත්තිකාරම් ලබාගෙන තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | වාහනය භාවිතා කරන නිලධාරියා විසින් ඉන්ධන අත්තිකාරම් ලබාගත යුතුවේ. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 08/2019 හා 2019 මාර්තු 27 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයට පටහැනිව, දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2019 මැයි මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වා කාලය වෙනුවෙන් අනුමත සීමාව ඉක්මවා රු.260,119ක් සංග්‍රහ වියදම් දීමනා ලෙස ලබාගෙන තිබුණි. | රැස්වීම් පැවැත්වීම බහුල වීම හේතුවෙන් අමතර වියදම් ඇති විය. | මාසික සංග්‍රහ දීමනාවට අමතරව සිදුකළ ගෙවීම් අදාළ නිලධාරියාගෙන් අය කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) අංක 11/2006 හා 2006 ජූලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3(ix) වගන්තියට අනුකූලව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2019 ජනවාරි සිට 2020 අගෝස්තු මාසය දක්වා කාලය තුළ මාසික ඉන්ධන දීමනා ලෙස රු.470,045ක් ලබාගෙන තිබුණි. එහෙත්, ඊට අමතරව හා එම චක්‍රලේඛයට පටහැනිව, රජයේ ඉන්ධන ඇණවුම් මගින් ද රු.444,875ක ඉන්ධන ලබා ගෙන තිබුණි. | දිස්ත්‍රික් ලේකම්වරයාට වෙන්කළ ප්‍රවාහන දීමනාවට අමතරව 2019 වර්ෂයේ පැවැති අයහපත් තත්ත්වය, 2020 වර්ෂයේ පැවැති වසංගත තත්ත්වය, කොළඹ පැවැති අමතර රැස්වීම් ආදී කරුණු මත අමතර ඉන්ධන ලබා දී තිබුණි. | අමතරව වැයකරන ලද මුදලක් වේ නම් නිලධාරියාගෙන් ආපසු අය කළ යුතුවේ. |

**2.6 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අත්හිටවූ සහ සේවය හැරගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් ගෙවිය යුතු රු.334,572 ක ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 වගන්තිය අනුව අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අයකර ගැනීම සඳහා පියවර ගෙන ඇත.. | ඇපකරුවන්ගෙන් හිඟ ණය ශේෂය අයකර ගැනීමට පියවර ගත යුතුවේ. |

**2.7 තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 02ක් ඉක්මවූ එකතුව රු. 1,585,834ක් වූ කොන්ත්‍රාත් වෙනුවෙන් රඳවාගත් තැන්පතු 20 ක් පොදු තැන්පත් ගිණුමේ ශේෂව පැවැතිණි. එමෙන්ම, 2020 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පතු ගිණුමේ ශේෂය හා එදිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර රු. 5,375ක වෙනසක් පැවතිණි. | රඳවා ගැනීමේ තැන්පතු ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට මාරු කිරීමටත්, ගිණුම් අතර පවතින වෙනස නිරවුල් කිරීමටත් කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 571 අනුව තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා තැන්පතු ශේෂ අතර නොසැසඳීමට හේතු විමසා ඒවා නිරවුල් කිරීමට පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි නොවුණු කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් එම බදු ගෙවිය යුතු බව සලකා රු.425,752ක බදු මුදල් තැන්පතු ගිණුමට බැර කර තිබුණි. ප්‍රමාණවත් කාලයක් ගත වී තිබුණ ද, ඒවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | බදු සඳහා ලියාපදිංචි වීම් ලබාගෙන ඉදිරිපත් කිරීමට හිමිකරුට උපදෙස් ලබා දී ඇත. | ලියාපදිංචි නොවුණු කොන්ත්‍රාත්කරුවන් සඳහා බදු හිමිකමක් නොමැති බැවින් එම මුදල් රජයේ ආදායමට බැර කිරීමට පියවර ගැනීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටමට ළඟා නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ, 2019 වර්ෂයේදී ප්‍රතිලාභීන් 26 දෙනෙකු වෙත කුකුල් කූඩු ඉදි කිරීම සඳහා රු. 1,169,870 ක් ගෙවා තිබුණ ද, එම ඉදි කිරීම් කිසිවක් ඉටු වී නොතිබීම නිසා වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් ඇති විය. වර්තමානයේ සුදුසු උපදෙස් ලබා දී කුකුල් කූඩු ඉදිකිරීම් අවසන් කර භාවිතා කෙරේ. | භෞතික පරීක්ෂාවකින් අනතුරුව වැඩ අවසන් කිරීමේ වාර්තාව ලබාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් සිදු කළ යුතුවේ. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 10ක් වූ මාර්ගයක ඉදි කිරීම 2019 නොවැම්බර් මාසයේ දී නිම කළ යුතු ව තිබුණ ද, 2021 මාර්තු මාසය දක්වාම එය නිමකර නොතිබුණි. මේ සඳහා දින දීර්ඝ කිරීම් ද ඉල්ලා නොතිබුණු බැවින් හා ගිවිසුම්ගත පරිදි කාර්යයන් ඉටු නොවීම නිසා ගිවිසුම අවලංගු කර කාර්යසාධන බැඳුම්කරය රජයේ ආදායමට බැර කිරීමට අප්‍රමාදව තීරණයක් ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එම බැඳුම්කරය කොන්ත්‍රාත්කරු විසින් නිදහස් කරගෙන තිබුණි. වැඩබිමට ගෙන ආ අමුද්‍රව්‍ය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළ ද, ආරක්ෂා කර ගැනීම | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශන කමිටුවක් ස්ථාපිත කර ඇත. කමිටු වාර්තාව අනුව ක්‍රියාමාර්ග ගෙන ඉදිරි කාලයේදි පිළිතුරු ලබාදෙනු ලැබේ. | රජයේ අරමුදල්වලට කිසිදු පාඩුවක් නොවන පරිදි එම ඉදි කිරීම් කාර්යයන් නිම කළ යුතු වීම. |

සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් ඒවා අස්ථාන ගත වෙමින් හා විනාශ වෙමින් පැවැතිණි. අත්හැර දමා ඇති මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වූ කාර්යසාධන බැඳුම්කර වටිනාකම, අමුද්‍රව්‍ය පිරිවැය හා කොන්ත්‍රාත්කරුට කළ ගෙවීම් ලෙස එකතුව රු. 1,995,318ක පාඩුවක් රජයට සිදු වී තිබුණි.

## 3.3 ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් මාසයේ ආරම්භ කළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන අංගනය, තොරතුරු තාක්ෂණ උද්‍යානය හා තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා අදියර 03ක් යටතේ රු.52,694,249ක් ගෙවා තිබුණි. එහෙත්, 04 වැනි අදියරයේදි දෙවතාවක් කාලය දීර්ඝ කිරීම් ලබා දී 2021 පෙබරවාරි මාසයේ වැඩ අවසන් කළ යුතු වූවත්, පිරිවැය රු.2,058,715ක් වූ ව්‍යාපෘති කාර්යයන් භෞතික පරීක්ෂාව සිදු කළ 2021 අප්‍රේල් මාසය දක්වාම අවසන් කර නොතිබුණි. | මූලධන කාර්යයන් පිළිබඳ සමාලෝචන රැස්වීමේදි 2021 අප්‍රේල් 22 දින දක්වා කාලය දීර්ඝකිරීම් ලබා දී ඇත. ප්‍රමාද වන කාලය වෙනුවෙන් දඩ ගාස්තු අය කෙරේ. | නියමිත කාලය තුළ කාර්යයන් අවසන් කිරීමට පියවර ගත යුතු වේ. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මැහුම් පුහුණු මධ්‍යස්ථානයක තිබුණු යන්ත්‍ර අස්ථානගත වීම සම්බන්ධයෙන් 2019 නොවැම්බර් මාසයේදී පැමිණිලි කර තිබුණ ද, මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඊට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරිමට පියවර ගෙන ඇත. | විමර්ශනය කඩිනමින් අවසන් කර සුදුසු පියවර ගත යුතු වේ. |
| (ආ) එකතුව රු. 1,371,155ක් වූ ගෙවීම් 49ක් හඳුනාගත නොහැකිව 2015 වර්ෂයේ සිට පවතින නමුත් ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරිමට පියවර ගෙන ඇත. | විමර්ශනය කඩිනමින් අවසන් කර සුදුසු පියවර ගත යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2020 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු 206ක් පැවැතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් කටයුතු කරමින් පවතී. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම. |